# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මැයි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 15/74

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1974 අංක 1 දරන පනතින් අන්තිම වරට සංශෝධිත, (මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ (i) අනුඡේදය අගට පහත සඳහන් අලුත් කරුණ එකතු කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1963 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉ) යම් වාසස්ථානයක අයිතිකරු මිය යන විට බුදල් බදු ආඥා පනතෙහි අර්ථානුකූලව ඔහුට බැහැර කිරීමට බලය තිබුණා වූ එකී දේපළට වෙනත් වාසස්ථානයක් ඇතුළත්ව නැත්තා වූත් එම ආඥාපනතෙහි අර්ථානුකූලව ඔහුගේ මුළු බුදලයෙහි වටිනාකම රුපියල් එක්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නා වූත් අවස්ථාවක, 1973 නොවැම්බර් 1 වන දින හෝ ඉන් පසු, අයිතිකරු මිය ගිය විට ඒ වාසස්ථානයේ හිමිකම පිළිබඳව ඇතිවන වෙනස්වීමක්.".

3. (1) 1974 අංක 1 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය, පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (අ ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අ ආ) යම් කුඹුරක වගා කරන ලද වී—

(i) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලයට හෝ එම පනතෙහි අර්ථානුකූල වූ යම් බලය ලත් ගැනුම්කරුවකුට ; හෝ

(ii) කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට

විකිණීමෙන් එම කුඹුරේ හිමියා හෝ ගොවියා විසින් 1973 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලබන ලද ලාභ සහ ආදායම;";

තවද

2—ඒ 12610—12,616 (75/02)

(ආ) ඒ උපවගන්තියේ (1971 අංක 33 දරන පනතින් එහි ඇතුළත් කරන ලද) (ඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇඇඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරයේ, පොල් පර්යේෂණ මණ්ඩලයේ සහ පොල් වගා මණ්ඩලයේ ලාභ සහ ආදායම ;".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි කරන ලද සංශෝධනය 1974 අංක 1 දරන පනත බලාත්මක වූ දිනය වන 1974 ජනවාරි මස 10 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වන වගන්තිය සංශෝධනය කිරීම.

4. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ (1972 අංක 17 දරන පනතින් එහි ඇතුළත් කරන ලද) 7අ වන වගන්තිය, එහි (9) වන උපවගන්තියෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "අපනයන ලාභ සහ ආදායම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "අපනයන ලාභ සහ ආදායම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, එම සමාගමේ හෝ ව්‍යාපාරයේ අපනයන පිරිවැටුම හා ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ මුළු පිරිවැටුම හා අතර අනුපාතය මේ පනතෙහි විධිවිධාන අනුව ගණන් බලනු ලබන ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ (මේ පනතේ 5අ වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් ලාභ හා ආදායම අත් හැරීමෙන් පසු, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ) ලාභ සහ ආදායම හා යම් මුදලක් හා අතර ඇති වෙද ඒ මුදල අදහස් වේ.' ;

(ආ) "අපනයන පිරිවැටුම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "අපනයන පිරිවැටුම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු පිණිස සේවාවන් සැපයීමෙන් ඒ සමාගමට හෝ ව්‍යාපාරයට ලැබුණු හෝ ලබාගත හැකි සම්පූර්ණ මුදල අදහස් වන නමුත් එයට—

(අ) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ;

(ආ) මැණික් විකිණීමෙන් ඇති වන්නා වූ ලාභ සහ ආදායම මේ පනතේ 5අ වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් අවස්ථාවක, එම මැණික් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ;

(ආ) තොග වශයෙන් කළු තේ හෝ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, අමු පොල්, පොල් කෙඳි හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනයකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියෙහි කාර්යයන් සඳහා නියම කරන ලද වෙන යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය කිරීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ; සහ

(ඇ) 3 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේද යෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදායම නොවන ලාභ හා ආදායම් කිසිවක්

ඇතුළත් නොවේ ; ' ; තවද

(ඇ) ''මුළු පිරිවැටුම'' යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' ''මුළු පිරිවැටුම'' යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, ඒ සමාගම හෝ ව්‍යාපාරය විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කර ගෙන යනු ලබන යම් කර්මාන්තයකින් හෝ වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබුණු හෝ ලබා ගත හැකි මුළු මුදල අදහස් වන නමුත් එයට—

(අ) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ;

(ආ) මැණික් විකිණීමකින් ඇතිවන්නා වූ ලාභ සහ ආදායම මේ පනතේ 5අ වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් අවස්ථාවක, එම මැණික් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ; සහ

(ඇ) 3 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේද යෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදායම නොවන ලාභ සහ ආදායම

ඇතුළත් නොවේ. '.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වන වගන්තියෙහි කරන ලද සංශෝධන ඉහත කී 7අ වන වගන්ති යෙහි විධිවිධාන ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලබන දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

5. 1969 අංක 6 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියෙහි (6අ) වන උපවගන්තිය ඉවත් කොට පහත සඳහන් අලුත් උපවගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් එම වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

' (6අ) මේ වගන්තියෙහි (6) වන උපවගන්තිය—

(අ) 1969 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1973 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළවීමේ දී එහි ''රුපියල් පන්සියයක'' යන වචන වෙනුවට ''රුපියල් නව සියයක'' යන වචන ආදේශ කරන ලද්දක් මෙන් ද;

(ආ) 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඒ ඒ එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළවීමේ දී ''රුපියල් පන්සියයක'' යන වචන වෙනුවට ''රුපියල් එක් දහස් දෙසියයක'' යන වචන ආදේශ කරන ලද්දක් මෙන් ද

බලපැවැත්විය යුතු ය. '.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(2) 1963 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1973 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වන (මේ උපවගන්තියෙහි මින් මතු ''උචිත තක්සේරු වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම තක්සේරු වර්ෂයක් ම සඳහා තෑගි බද්දට යටත් යම් තැනැත්තකු විසින් උචිත තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි පිරිනමනු ලැබූ බදු අයකළ හැකි තෑගිවල වටිනාකම 1958 ජූලි 18 වන දින හෝ ඉන් පසුව හා ඒ පෙරාතුව වූ වර්ෂයට පෙර ඔහු විසින් පිරිනමනු ලැබූ බදු අයකළ හැකි තෑගිවල වටිනාකමට එකතු කරනු ලැබිය යුතු ය. එවිට, එසේ එකතු කිරීමෙන් ලැබෙන මුදල, තෑගි බද්ද නියම කළ හැකි, බදු අයකළ හැකි තෑගිවලට වටිනාකම යයි සලකමින්, තෑගි බද්ද පිළිබඳ උචිත අනු ප්‍රමාණ අදාළ කරගනිමින් ඒ බදු ප්‍රමාණය ආගණනය කළ යුතු ය. එසේ ආගණනය කරනු ලැබූ ඒ මුදල් ප්‍රමාණයෙන්, 1959 අංක 14 දරන පුද්ගල බදු පනත යටතේ අයකරන ලද පුද්ගලික බද්ද සඳහා බදු අයකළ හැකි තෑගි වෙනුවෙන් දයක මුදල් වශයෙන් හෝ මේ පනත යටතේ තෑගි බද්ද වශයෙන් හෝ ඔහු විසින් කලින් ගෙවනු ලැබූ සියලු ම මුදල් අඩු කරනු ලැබිය යුතු ය. එලෙස අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල් ප්‍රමාණය උචිත තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ඔහුගේ තෑගි වෙනුවෙන් තෑගි බදු ප්‍රමාණය විය යුතු ය.' ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(2අ) 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම සඳහා, බදු අයකළ හැකි තම තෑගි වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු තෑගි බද්ද වූ කලී—

(අ) ඒ තැනැත්තා විසින් 1958 ජූලි 18 වන දින හෝ ඉන් පසුව හා (මේ උපවගන්තියේ මින් මතු ''පෙරාතුව වූ වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන) එම තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය අවසාන වීමට පෙර, මේ පනතේ හෝ 1959 අංක 14 දරන පුද්ගල බදු පනතේ අර්ථානුකූලව පිරිනමන ලද බදු අයකළ හැකි සියලු ම තෑගිවල මුළු වටිනාකම මත, පෙරාතුව වූ වර්ෂය තුළ

පිරිනමන ලද බදු අය කළ හැකි තැගිවලට අදාළ වන්නා වූ ද, මේ පනතේ හය වන උපලේඛනයේ දක්වෙන තැගි බද්ද පිළිබඳ වූ ද ප්‍රමාණ අනුව ආගණනය කරන ලද ප්‍රමාණය; සහ

(ආ) ඒ තැනැත්තා විසින් 1958 ජුලි 18 වන දින හෝ ඉන් පසුව හා පෙරාතුව වූ වර්ෂය ආරම්භ වීමට පෙර, මේ පනතේ හෝ 1959 අංක 14 දරන පුද්ගල බදු පනතේ අර්ථානුකූලව පිරිනමන ලද බදු අයකළ හැකි තැගිවල මුළු වටිනාකම මත, පෙරාතුව වූ වර්ෂය තුළ පිරිනමන ලද බදු අයකළ හැකි තැගිවලට අදාළ වන්නා වූ ද, මේ පනතේ හය වන උපලේඛනයේ දක්වෙන තැගි බද්ද පිළිබඳ වූ ද ප්‍රමාණ අනුව ආගණනය කරන ලද ප්‍රමාණය

අතර පවතින වෙනස ය.''.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 69ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 69ඇ වන වගන්තිය ලෙස බල පවත්වන්නේ ය :— 69ඇ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"වෘත්තියක් කරගෙන යාම නවත්වා සේවා නියුක්තියක් ආරම්භ කරන තැනැත්තන් සම්බන්ධයෙන් වූ සහනය.

69ඇ. 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ලාභවලට හා ආදායමට—

(අ) එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු අවසාන කළ යම් වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලද ලාභ හා ආදායම සහ එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී හෝ එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු ආරම්භ කළ යම් සේවා නියුක්තියකින් ලද ලාභ, හෝ

(ආ) එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු අවසාන කළ යම් වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලද ලාභ හා ආදායම සහ එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු ආරම්භ කළ සේවා නියුක්තියකින් ලද ලාභ

ඇතුළත් වන අවස්ථාවක, 1975 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර එම තැනැත්තා විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, කාරණයේ අවස්ථානුගත තත්ත්වයන් අනුව අවශ්‍ය විය හැකි සහනයක් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි ය. ඒ සහනය දෙනු ලැබූ අවස්ථාවක, 103 වන හා 117 වන වගන්තිවල කුමක් සඳහන් ව ඇත ද, ඒ

තැනැත්තා සම්බන්ධයෙන් කරන ලද තක් සේරුව සංශෝධනය කොට සංශෝධිත තක් සේරුවෙන් අය කෙරෙන බද්දට අතිරික්තව ගෙවනු ලැබ ඇති යම් මුදලක් ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 73 වන වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(9) (2), (3), (4), (6අ) හා (8) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, 1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්—

(අ) අග්‍රාමාත්‍ය, (අග්‍රාමාත්‍ය නොවන) අමාත්‍ය, ජාතික රාජ්‍ය සභාවේ කථානායක, නියෝජ්‍ය කථානායක හෝ නියෝජ්‍ය කාරක සභා සභාපති හෝ නියෝජ්‍ය අමාත්‍ය ධුරය තත්කාලයේ දරන්නා වූ යම් තැනැත්තකු පිළිබඳව වූ විට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකයෙන්, (2), (3), (4) සහ (6අ) වන උපවගන්තිවල සඳහන් රුපියල් තුන්සියයක් වූ මුදල වෙනුවට, රුපියල් හත්සියයක් වූ මුදලක්, ඒ තැනැත්තාගේ එම ධුරයෙන් උපදින්නා වූ ලාභ හා ආදායම නිශ්චය කිරීමේ දී සැලකිල්ලට නොගත යුතු ය ; තව ද

(ආ) ((අ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු නොවන) මහජන මන්ත්‍රීවරයකු වන තැනැත්තකු පිළිබඳ ව වූ විට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකයෙන්, (8) වන උපවගන්තියෙහි සඳහන් වෙනත් දීමනාවල මුදලින් හරි අඩක් වෙනුවට, රුපියල් හත් සියයක් වූ මුදලක් ඒ මන්ත්‍රීවරයා වශයෙන් වූ ඒ තැනැත්තාගේ ලාභ හා ආදායම නිශ්චය කිරීමේ දී සැලකිල්ලට නොගත යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 96ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ (1972 අංක 17 දරන පනතින් එහි ඇතුළත් කරන ලද) 96ආ වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, පහත සඳහන් අලුත් උපවගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් :—

''(2) 1972 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ ප්‍රථම ත්‍රෛමාසික වාරික දෙක, 1973 ජනවාරි මස පසළොස් වන දින හෝ ඊට පෙර ද ඊළඟ ත්‍රෛමාසික වාරික දෙක පිළිවෙළින් 1973 පෙබරවාරි මස පසළොස් වන දින හෝ ඊට පෙර ද අප්‍රේල් මස තිස් වන දින හෝ ඊට පෙර ද ගෙවනු ලැබිය යුතු ය. යම් පසුව එළඹෙන තක්සේරු වර්ෂයක් සඳහා වූ ත්‍රෛමාසික වාරික පිළිවෙළින්, එම තක් සේරු වර්ෂයේ අගෝස්තු, නොවැම්බර් සහ පෙබරවාරි මාසවල

පසළොස් වන දින හෝ ඊට පෙර ද රිළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ මැයි මස පසළොස් වන දින හෝ ඊට පෙර ද ගෙවනු ලැබිය යුතු ය.'' ; තවද

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(6) බද්දක ත්‍රෛමාසික වාරිකය හෝ ඒ වාරිකයෙන් කොටසක් හෝ ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, එසේ පැහැර හැරි තැනැත්තා විසින්, ගෙවීම පැහැර හැර ඇති බදු මුදලට අතිරේකව, දණ්ඩනයක් වශයෙන්—

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට පහකට සමාන මුදලක්, සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති මුදල, එසේ පැහැර හැරීම පටන් ගැනීමෙන් පසුව දවස් තිහක් ඉකුත්වීමට පෙර නොගෙවන ලද අවස්ථාවක, එම ගෙවීම තවදුරටත් පැහැර හැරෙන එක් එක් දවස් තිහක කාලයක් හෝ ඒ කාලයෙන් කොටසක් හෝ වෙනුවෙන්, ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට එකකට සමාන අතිරේක මුදලක්

ගෙවිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය.''.

(ඇ) ඒ වගන්තියේ අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

'' (7) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක් කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන අවස්ථානුගත කරුණු අනුව සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකට අත්හැර දැමීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.''.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 96අ වන වගන්තියෙහි කරන ලද සංශෝධනය 1972 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ඒ දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයකට ම අදාළ වන්නේ ය.

116අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 116අ වන වගන්තිය ලෙස බලපවත්වන්නේ ය :—

''කොමසාරිස්වරයාගේ බලතල සහ කාර්යයන් පවරාදීම.

116අ. (1) මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල හෝ කටයුතු අතුරින් කිසිවක් ඔහු විසින් තම අත්සන යෙදූ ලියවිල්ලක් මගින් යම් තක්සේරුකරුවකුට පවරා දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කටයුතු කිසිවක් පවරා දෙනු ලැබූ සෑම තක්සේරුකරුවකු ම විසින් කොමසාරිස්වරයා ගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ ඒ කටයුතු කිරීම කළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ හය වන උපලේඛනයෙහි '' 1965 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත දෙන ලද තෑගි සඳහා වූ තෑගි බද්ද පස්වන උපලේඛනයේ II වන කොටසෙහි දක්වෙන සියයට ප්‍රමාණය හෝ සියයට ප්‍රමාණයන් අනුව විය යුතු ය.'' යන යෙදුම වෙනුවට පහත සඳහන් යෙදුම ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' කෙසේ වුව ද, 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත පිරිනමන ලද තෑගි සඳහා, බදු අය කළ හැකි සියලු ම තෑගිවල වටිනාකමේ ප්‍රථම රු. 50,000 වෙනුවෙන් සියයට ප්‍රමාණය පස්වන උපලේඛනයේ II වන කොටසෙහි දක්වෙන සියයට 5 වෙනුවට සියයට 3 ක් විය යුතු ය යන වෙනස් කිරීමට යටත්ව, 1965 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත පිරිනමන ලද තෑගි සඳහා වූ තෑගි බද්ද පස් වන උපලේඛනයේ II වන කොටසෙහි දක්වෙන සියයට ප්‍රමාණය හෝ සියයට ප්‍රමාණයන් අනුව විය යුතු ය.''.